ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2025 ජූලි

යෝජිත උත්තර

(203) ව්‍යාපාර නීතිය (BLA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2025 ජූලි

(203) ව්‍යාපාර නීතිය

යෝජිත උත්තර

(මුළු ලකුණු 25)

A කොටස

පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:

1.1 (2)

1.2 (4)

1.3 (2)

1.4 (2)

1.5 (2)

1.6 (3)

SRI LANKA

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 12)

1.7 සත්‍ය

1.8 අසත්‍ය

1.9 අසත්‍ය

(එක ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)

1.10 පහත ඒවායින් කැමති දෙකක්:

- නෞභාර පත්‍රය (Billing of Landing)
- නෞභාර පත්‍රය (Invoice)
- රක්ෂණ සහතිකය (Insurance Certificates)
- ගිවිසුමට සම්බන්ධ අනෙකුත් ලේඛන (උදා: සනීපාරක්ෂක සහතික, ප්‍රභවස්ථාන සහතික, බර හෝ තත්ත්වය පිළිබඳ සහතික, ගුණාත්මකභාවය / ප්‍රමිතිය පිළිබඳ සහතික)

1.11 ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය තහනම් කිරීම සඳහාද, මුදල් විශුද්ධිකරණය මර්ධනය කිරීම සහ වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර සැළැස්වීම සඳහාද ඒ සම්බන්ධ අනුශාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැළැස්වීම සඳහාද වේ.

1.12 විනිමය බිල් පතක් පිටසන් කල යුතු වන්නේ විනිමය බිල් පතක් ගනුදෙනු කළ හැකි තත්ත්වයට පත් කිරීම සඳහාය. විනිමය බිල්පතක් පැවරීමේදී පැවරුම්කරු විසින් විනිමය බිලේ පිටුපස තමාගේ නම පැහැදිලිව ලිවීම පිටසක් කිරීම ලෙස හැඳින්වේ. විනිමය බිල්පතක අයිතිය අතහැරීම, අයිතිය පැවරාදීම හෝ නිර්ව්‍යාජ ලෙස අයිතිය පවරා දීමක් පිටසන් කිරීමේ අරමුණ හෙවත් කාර්යයභාරය වේ.

1.13 පහත ඒවායින් කැමති දෙකක්:

- ආයෝජකයන් සමග ව්‍යාපෘති යෝජනා පිළිබඳ සංවාද පැවැත්වීම.
- ස්වේච්ඡා ව්‍යාපෘති පිළිගැනීම, අවශ්‍ය පියවර ගැනීමට අදාල රජයේ ආයතන වෙත යොමු කිරීම සහ පරීක්ෂා කිරීම.
- විශේෂ උපදේශන සහාය සැපයීම සහ අදාල ලේඛන සකස් කිරීම.
- බදු සහ අනෙකුත් සහන සැපයීම.
- අනාගත ආයෝජකයන් සඳහා යටිතල පහසුකම් ව්‍යාපෘති වෙළඳපොලට හඳුන්වා දීම.

1.14 පහත ඒවායින් කැමති දෙකක්:

- පොරොන්දු නෝට්ටු (Primissory Notes)
- විනිමය බිල්පත් (Bill of Exchanges)
- චෙක්පත් (Cheques)
- බැංකු අණකර (Bank Note)
- ලභාංශ බලපත්‍ර (Dividend Warrant)
- භාණ්ඩාර බිල්පත් (Tresasury Bills)
- ධාරක ණයකර (Bearer Debentures)

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)

(මුළු ලකුණු 25)

aat SRI LANKA

A කොටසෙහි අවසානය

දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

***පරිච්ඡේදය 04** - නියෝජ්‍යත්ව නීතිය)*

(a) මිනුකි සහ ශාමා විසින් නියෝජ්‍යත්ව නීතිය (Law of Agency) යටතේ ඇති කරගන්නා ලද ගිවිසුමට අනුව වගකීමට යටත් වන්නේද යන්න තීරණය කිරීමට, අපට නියෝජ්‍යත්ව නීතියේ මූලික සංකල්ප, විශේෂයෙන්ම සත්‍ය අධිකාරී බලය (Actual Authority) යටතේ, නියෝජිතයාගේ කාර්යභාරය, සහ ප්‍රධානියාගේ වගකීම පිළිබඳ විශ්ලේෂණය කළ යුතුය.

නියෝජිත නීතිය යටතේ, නියෝජිතයෙකුට ලබා දුන් බලය (Authority) යටතේ කරන ක්‍රියා සඳහා පමණක් ප්‍රධානියා වගකීමට බැඳේ. අධිකාරී බලය ස්වරූප තුනකින් පැනනැගිය හැකිය : සත්‍ය බලය (Empress Authority), ව්‍යංග බලය (Implied Authority), සහ විද්‍යාමාන බලය (Apparent Authority). මෙම අවස්ථාවට අදාළ වන්නේ ප්‍රධාන වශයෙන් සත්‍ය බලයයි.

මෙම අවස්ථාවේ, මිනුකි ශාමාව ඇගේ නියෝජිත ලෙස සෘජුවම පත්කර, ඇයට බලය ලබා දුන්නේ,

- විකුණුම් සඳහා විදුලි උපකරණ මිලදී ගැනීමට ගිවිසුම් සාකච්ඡා කිරීම සඳහා,
- මිනුකි වෙනුවෙන් ගිවිසුම් වලට අත්සන් කිරීම,

යන කාරණා සඳහාය.

ඒ අනුව, ශාමා සැපයුම්කරු සමඟ ගිවිසුමකට ඇතුළු වූ විට ඇය සත්‍ය අධිකාරී බලය යටතේ ක්‍රියාත්මක වී ඇත. ඇය මිල හෝ විස්තර මිනුකිට නොදැක්වූවා වුවත්, එය ප්‍රධානියා වන මිනුකි සහ නියෝජිත වන ශාමා අතර ඇති නියෝජ්‍යත්ව ගිවිසුම උල්ලංඝනයකට තුඩු නොදේ, ශාමා ඇගේ බලය ඉක්මවා ක්‍රියා කර නැත. ඒ අනුව, ශාමාට ලබා දුන් බලය යටතේ ක්‍රියා කිරීම නිසා මිනුකි (ප්‍රධානියා) මෙම ගනුදෙනුවට අදාළ වගකීම බාරගත යුතුය.

(ලකුණු 04)

(b) ශාමාට (නියෝජිත) සත්‍ය අධිකාරී බලය ලැබී ඇති නිසා ඇය අත්සන් කළ ගිවිසුම මගින් මිනුකි (ප්‍රධානියා) තුන්වන පාර්ශවයන් සමග ගිවිසුම්කව බැඳී සිටින නමුත්, එය ශාමා විසින් තම ප්‍රධානියා වන මිනුකිට නියෝජිතයෙකු වශයෙන් ඉටුකළ යුතු යුතුකම් උල්ලංඝනයකට (Breach of Duty) විරුද්ධව ප්‍රතිකර්ම අයකරවා ගැනීමෙන් මිනුකිව (ප්‍රධානියා) වළක්වාන්නේ නැත.

නියෝජිත නීතිය යටතේ, නියෝජිතයෙකුට ඔහුගේ ප්‍රධානියා කෙරේ (Principal) විවිධ යුතුකම් තිබේ. එවන් වගකීම් උල්ලංඝනය කළහොත් ප්‍රධානියට තම නියෝජිතයාට විරුද්ධව නීතිමය ප්‍රතිකර්ම ලබාගැනීමට හැක.

නියෝජිතයෝ විශ්වසනියත්වයේ යුතුකම් තත්වයක ලා (Fiduciary Duty) සිටිති. ඒ අනුව, ඔවුන් උපරිම විශ්වාසයෙන් (ය්දදා ත්එය), පක්ෂපාත භාවයෙන් (Loyalty), සහ ප්‍රධානියාගේ උපරිම යහපත උදෙසා (In the Best interest of the Principal) ක්‍රියා කළ යුතුය. ගිවිසුමක කොන්දේසි හෝ අසාමාන්‍ය ලෙස ඉහළ මිලක් වැනි ගිවිසුමක වැදගත් කරුණු ආදිය ප්‍රධානියාට අනාවරණය නොකිරීම උක්ත නියෝජිතයාගේ විශ්වසනියත්වයේ යුතුකම උල්ලංඝනය විය හැක.

නියෝජිතයෙකු තම කාර්යභාර ඉටු කළ යුත්තේ, සමාන තත්ත්වයක සිටින සාධාරණ පුද්ගලයෙකුගෙන් (Reasonable Man) අපේක්ෂා කළ හැකි අවධානය සහ දක්ෂතාවය මට්ටමෙන්ය (Standard of care and Skill). ශාමා, වෙළඳපොල මිලට වඩා ගොඩක් ඉහළ මිලකට භාණ්ඩ මිලදී

ගැනීම, සහ එය මිනුකිට දැනුම් නොදීම, ඇයගේ අවධානය හා දක්ෂතාවය පිළිබඳ වගකීම උල්ලංඝනය කළ හැකි නොසැලකිලිමත් (Negligent) ක්‍රියාවක් ලෙස සැලකිය හැක.

Case Law (Turpin v. Bilton)
මෙම නඩුවේදී, නියෝජිතයෙකුට දී තිබූ උපදෙස් අනුව භාණ්ඩ රක්ෂා නොකිරීම පිළිබඳව ඔහු වගකිව යුතු බව නියම කළේය. අධිකරණය අවධාරණය කළේ, නියෝජිතයා සම්පූර්ණ අවධානයෙන් ක්‍රියා කළ යුතු බවත්, එය නොකළහොත් ඔහු අලාභ පිළිබඳ වගකිව යුතුය යන්නයි.

ශාමාගේ සිද්ධියේදී, ගිවිසුම සිදු කිරීමේදී සුරක්ෂිත හා බුද්ධිමත් ලෙස ක්‍රියා නොකිරීම මිනුකිට පූර්වකල්පිත (Foreseeable) ආර්ථික අලාභයක් ඇති කළේය. ඒ අනුව, මිනුකිට ඇති වූ අලාභය සඳහා වන්දි (Damage) ශාමාගෙන් ලබාගැනීමේ අයිතිය ප්‍රධානියා වන මිනුකිට ඇත.

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

පරිච්ඡේදය 07 - කම්කරු නීතිය

(a) 1983 අංක 12 දරන පාරිශෝෂික ගෙවීමේ පනත යටතේ, විශේෂයෙන් බැහැර කර නොමැති සේවකයෙකුට, සේවය අවසන් වූ විට ග්‍රැච්චිටි ගෙවීමක් ලබාගැනීමට අයිතිය ඇත. එය ලබාගැනීම සඳහා, එම සේවකයා එකම සේවායෝජකයා යටතේ අවම වශයෙන් වසර පහ (05) ක් අඛණ්ඩව සේවය ඉටු කර තිබිය යුතුය.
සේවක පාරිශෝෂික ගණනය කරන ආකාරය පහත සූත්‍රය අනුවයඃ

පාරිශෝෂික = සම්පූර්ණ කරන ලද සේවා වසර ගණන X අවසන් මස ලද වැටුප x 1/2

මෙම සිද්ධියේදී, ඇන් 2016 අප්‍රේල් මස 01 වන දින සිට සමාගමේ සේවය ආරම්භ කළ අතර, 2025 ජූනි මස 30 වන දින ඉල්ලා අස්වීය. ඒ අනුව ඇය සම්පූර්ණ අඛණ්ඩ සේවය අවුරුදු 9ක් ඉටු කළා. ඇයගේ අවසන් මාසික වැටුප රු. 300,000/- වේ.

පාරිශෝෂික = 9 X 300,000ව X 1/2 = රුපියල් 1,350,000/-

එමගින්, ඇන්ට තම ඉල්ලා අස්වීමේදී සේවායෝජකයාගෙන් රු. 1,350,000/- පාරිශෝෂිකයක් ලබාගැනීමට අයිතිය ඇත.

(ලකුණු 04)

(b)

- සති නිවාඩු (Weekly Holidays)
- වාර්ෂික නිවාඩු (Annual Leave)
- අනියම්/ සාමාන්‍ය නිවාඩු (Casual Leave)
- ප්‍රසිද්ධ නිවාඩු (Public Holidays)
- පෝය නිවාඩු (Poya Holidays)
- ප්‍රසූත නිවාඩු (Maternity Leave)

(ලකුණු 03)

(c)

- වෙනස්කමකින් තොරව (Non-Discrimination) සමාන සැලකීම් ලැබීමේ අයිතිය.
- කැමැත්ත මත රැකියාවක හෝ වෘත්තියක නිරතවීමේ අයිතිය.
- සමාන වැටුප් හා සාධාරණ සැලකිල්ලක් ලබීමේ අයිතිය.
- සාධාරණ හා ආරක්ෂිත සේවා කොන්දේසි ලබාගැනීමේ අයිතිය.
- සංගමයේ නිදහස .
- වෘත්තීය සමිති වලට බැඳීමේ අයිතිය.
- පෞද්ගලිකත්වයේ අයිතිය.
- නිවාඩු ලබාගැනීමේ අයිතිය.
- කළ සේවය සඳහා ගෙවීම් ලබීමේ අයිතිය.

(ලකුණු 03)
(මුළු ලකුණු 10)

හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

***පරිච්ඡේදය 08* - රක්ෂණ, කල්බදු, කුලී සින්නක්කර හා ණය සම්බන්ධ නීතිය**

(a)සමන්තාගේ රක්ෂණය වන්දි රක්ෂණ සමාගමෙන් අයකරගැනීමේ හැකියාව, "උපරිම විශ්වාසය" (Utmost Good Faith) යන රක්ෂණ මූලධර්මය මත පදනම් වේ.

මෙම මූලධර්මය යටතේ, රක්ෂිතයා විසින් තම රක්ෂණය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ තීරණය සම්බන්ධයෙන් රක්ෂණ සමාගමට බලපාන සියලු වැදගත් කරුණු සම්පූර්ණයෙන්ම සහ සත්‍ය ලෙස හෙළිදරව් කළ යුතුය. වරදවා දැක්වීමක් සිදුවන ප්‍රකාශයක් සිදු වුවහොත්, නමුත් එය ද්වීෂසහගත චේතනාවකින් තොරව/ සද්භාවී චේතනාවෙන් කර තිබුනද එම ප්‍රකාශය වැදගත් කරුණක් සම්බන්ධයෙන් **(Material Fact)** කරන ලද ප්‍රකාශයක් නම් රක්ෂණ සමාගමට ගිවිසුම අවලංගු කිරීමට අයිතිය ලැබේ.

SRI LANKA

<u>O'Conner</u> V. <u>BDB Kirby & Co</u> නඩුවේදී, රක්ෂිතයා වූ **O'Conner,** රක්ෂණ අයදුම්පත්‍රයේදී තම වාහනය ගරාජයක නවතා තබන බව සඳහන් කලත් නමුත්, සැබෑවට ඔහු එය පාරේ පමණක් නවතා තිබුණි. පසුව එම වාහනයට හානි සිදු වූ විට, අධිකරණය තීරණය කළේ, වාහනය නවතා තබන ස්ථානය පිළිබඳව කළ අසත්‍ය ප්‍රකාශය වැදගත් කරුණ **(Material Fact)** පිළිබඳ අසත්‍යතාවයක් බවත්, එම හේතුවෙන් රක්ෂණ සමාගමට ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට අයිතිය තිබෙන බවත්ය.

මෙම මූලධර්මය සමන්තාගේ සිද්ධියට අදාළ කර බලන විට, ඇය රක්ෂණ අයදුම් පත්‍රයේ තම වෙළඳසැලට ක්‍රියාකාරී CCTVපද්ධතියක් ඇතැයි සඳහන් කළා. නමුත් එම පද්ධතිය මාස තුනකට වැඩි කාලයක් අක්‍රියව පැවතියේය, සහ ඇය එය පරීක්ෂා කර නැති අතර අළුත් කර හෝ අලුත්වැඩියා කර නොතිබුණි. ඇයගේ මෙම අසත්‍ය ප්‍රකාශය, සාපරාදීව සිදු නොවුනත් (අහිංසකව-ඇය ඒවා ක්‍රියාත්මක නොවන බව නොදන්නා බැවින්), එම ප්‍රකාශය රක්ෂණ සමාගම විසින් රක්ෂණ ආවරණය **(coverage)** ලබාදීමට කැමති වන හෝ/ හා නීති කොන්දේසි වෙනස් කිරීමට බලපාන වැදගත් කරුණක් වේ.

එබැවින්, ***<u>O'Conner</u> V. <u>BDB Kirby & Co</u>*** නඩුවේම මූලධර්මය සලකාබලන සිද්දියට ආදේශ කර බැලීමේදී, අධිකරණය සමන්තාගේ ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් ලෙස සලකා, රක්ෂණ සමාගමට ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට අවසර දෙනු ඇත. ඒ අනුව, වරදවා දැක්වීමේ නීතිය **(Law of Misrepresentation)** සහ උපරිම විශ්වාසය මූලධර්මය යටතේ, සමන්තාට තම රක්ෂණ ගෙවීම/ වන්දි ලබාගැනීමට හැකි නොවීමේ වැඩි නැඹුරුවක් වන අතර, ඇයගේ අසත්‍ය ප්‍රකාශය ගිවිසුම මත වැදගත් බලපෑමක් ඇති කර ඇත. ***(ලකුණු 04)***

(b) රක්ෂණ සමාගම **(රක්ෂක)** විසින් රක්ෂණය කරගත් දේපලට සිදු වූ හානිය සම්බන්ධයෙන් අලාභය ගෙවා අවසන් වූ විට, රක්ෂණගත පුද්ගලයාට **(රක්ෂිතයට)** බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගත හැකි/ අය කරගත හැකි අනෙකුත් වාසි සහ අයිතිවාසිකම් සියල්ල අයකරගැනීමේ අයිතිය රක්ෂණ සමාගම වෙත මාරු වීම ආදේශනය (**Subrogation**) ලෙස හැඳින්වේ. ඇත්තෙන්ම මෙම සංකල්පය බිහිවන්නේ හානි පූරණය මූලධර්මය (**Principle of Indemnity**) නිසාය.

උදාහරණයක් ලෙස, **X** තම භාණ්ඩ සඳහා ගිනි රක්ෂණයක් ගෙන, පසුව **Y** ගේ නොසැලකිලිමත්භාවය නිසා එම භාණ්ඩ ගිනිගෙන විනාශ වූ විට, **X** ට රක්ෂණ සමාගම විසින් ගෙවීම් සිදු කරනු ලැබුවහොත්, පසුව **X** ට **Y**ට විරුද්ධව **නඩු දමා එම හානිය අයකරගැනීමට තිබූ අයිතිය** දැන් **X** සිට රක්ෂණ සමාගම (රක්ෂක) වෙත මාරු වේ. මෙය ආදේශනය මූලධර්මය (**Doctrine of Subrogation**) යටතේ සිදු වේ.

කෙසේ වෙතත්, ***ජීවිත රක්ෂණය*** සහ ***අනතුරු රක්ෂණය*** සඳහා ආදේශනය මූලධර්මය අදාළ නොවේ.

(ලකුණු 03)

(c)
- නෛතිකව බැඳීමක් ඇති කරගැනීමේ චේතනාව (**Intention to create a legal obligation**)
- අර්පණය (රක්ෂණ යෝජනාව) (**Insurance offer or proposal**)
- ප්‍රතිග්‍රහණය (**Acceptance**)
- නෛතික බව (**Legal validity**)
- පාර්ශවයන්ගේ ගිවිසුම ශක්තතාවය (**Competent parties**)
- ප්‍රතිෂ්ඨාව (**Consideration**)

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:

පරිච්ඡේදය 05 - සමාගම් නීතිය

(a) 2007 අංක **07** දරන සමාගම් පනතේ **2** වන වගන්තිය ප්‍රකාරව **වෙන් වූ නෛතික පුද්ගලභාවයේ මූලධර්මය** අනුව, සමාගමක් තම කොටස් හිමියන්ගෙන් හා අධ්‍යක්ෂයින්ගෙන් වෙන් වූ ස්වාධීන නෛතික පුද්ගලයෙක් වේ. එයට දේපල හිමිකාරිත්වය දැරීමට, නඩු කීමටත්, නඩු අසිමකට යටත් වීමටත්, ගිවිසුම් වලට ඇතුළු වීමටත්, ණය ලබාගැනීමටත් හැකියාව ඇත. පනතේ **87** වන වගන්තියට අනුව, යම් කොටස්හිමියෙක් ගේ ක්‍රියාවක්, පහරහරීමක් හෝ සමාගමේ වගකීමක් සඳහා ඔහු සමාගමේ හුදු කොටස් හිමියෙක් වීමේ පදනම මත පුද්ගලිකව වගකීමකට බැඳෙන්නේ නැත.

මෙම මූලධර්මය ***Salomon** V. **A. Salomon & Co. Ltd*** නඩුවේදී දැඩිව පිළිගන්නා ලදී. එහිදී, **Salomon** මහතා එකම කොටස් හිමියා සහ සමාගමේ පාලකයා වුවත්, සමාගම වෙනම නීතිමය පුද්ගලයෙකි, එම නිසා එහි ණය **Salomon** මහතාගේ පෞද්ගලික ණය නොවන බව අධිකරණය තීරණය කළේය.

ශ්‍රී ලංකා වේ නඩුවක් වන, ***DFCC Bank Ltd** V. **Muditha Perera***, හිදී ද මෙම ස්ථාවරය ගත් අතර, සමගම ලබාගත් ණයට ඇපයක් ලෙස අධ්‍යක්ෂකයෙක් තම දේපළ තැන්පත් (ඇපයට තිබ්බා) කළා වුවද ද, සමාගමේ වගකීම් අධ්‍යක්ෂකයින්ගේ පෞද්ගලික වගකීම්වලින් වෙනස් බැවින් එය සෘජුවම අධ්‍යක්ෂකයාට අදාළ නොවන බව තීරණය කරන ලදී. එනම් පරාටේ **එස්කැසි නීතිය** (**Parate Execution**) අධ්‍යක්ෂක වරයෙකුට එරෙහිව ක්‍රියාත්මක කල නොහැක.

එමනිසා, මෙම නීති තත්වය සලකාබලන සිද්දිය සමග බැලීමේදී, **XYZ (Pvt) Ltd.** ස්වාධීන නෛතික පුද්ගලයෙක් වන අතර, **Amara** විසින් පෞද්ගලික ණය ගැනීමක් හෝ වංචාවක සම්බන්ධතාවයක් ඇතැයි සනාථ කරගැනීමට සාක්ෂි නැති නිසා, **Amara** වෙත සමාගමේ ණය පිළිබඳව පෞද්ගලික වගකීමක් නැත. ණය ගෙවීමේ වගකීම සම්පූර්ණයෙන්ම සමගම වෙතම පවතියි.

(ලකුණු 04)

(b)

- අධ්‍යක්ෂකවරුන් සහ ලේකම් වරුන්ගේ රේගජිස්ටරය (අධ්‍යක්ෂයින්ගේ සහ සමාගම් ලේකම්ගේ නාම, ලිපින, පත්වීම් දිනයන් සහ සේවයෙන් ඉල්ලා අස්වීම් දිනයන්.
- මහා සභා රැස්වීම් සහ අධ්‍යක්ෂක මණ්ඩල රස්වීම් වල කටයුතු වාර්ථා කිරිම සඳහා වන වාර්තා පොත්
- පැමිණීමේ නාම ලේඛන පොත්
- කොටස් හිමියන්ගේ අනුක්‍රමික අංක
- කොටස් රේජිස්ටරය **(Share Register)**
- ගාස්තු පිලිබඳ රෙජිස්ටරය **(Register of Charges)**
- සම්බන්ධතා රෙජිස්ටරය **(Register of Interest)**

(ලකුණු 03)

(c) නව **2007** අංක **07** දරන සමාගම් පනත මගින්, පෙර පවතී සමාගම් නීතියෙන් (**1982** පනත) වෙනස් වන වැදගත් වෙනසක් වන්නේ සාංගමික ව්‍යවස්ථාවේ අරමුණු වගන්තිය පිළිබඳව සමාගමට ලබා දී ඇති දැඩි නොවන ස්වභාවයයි. පරණ නීතිය යටතේ අරමුණු වගන්තියක් ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම අනිවාර්ය වූ අතර, <u>බලාතික්‍රමණ න්‍යාය</u> **(Ultra Vires Doctrine)** යටතේ සමාගමට හැකි වූයේ එම සඳහන් අරමුණු සීමාවන්ට යටත්ව පමණක් ක්‍රියා කිරීමයි. නමුත් **2007** නීතිය යටතේ, අරමුණු ඇතුළත් කිරීම අනිවාර්යය නොවේ. ව්‍යවස්ථාවට අරමුණු සඳහන් කර නොමැති වුවද, සමාගමට නීත්‍යානුකූල ඕනෑම ව්‍යාපාරයක යෙදිය හැක.

පනතේ **17** වන වගන්තියට අනුව, සාංගමික ව්‍යවස්ථාවේ අරමුණු සඳහන් කර ඇත්නම්, එම අරමුණු අනුව සමාගම ක්‍රියා කළ යුතුය. එහෙත් යම් ක්‍රියාවක්, ගිවිසුම්ගත වීමක් හෝ දේපළ මාරු කිරීමක්, සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් අරමුණු වගන්තියට ප්‍රතිවිරුද්ධ වුවද, අවලංගු නොවේ. නමුත් එවැනි කඩකිරීමක් අධ්‍යක්ෂයින්ගේ වගකීම් උල්ලංඝනයක් ලෙස සැලකිය හැක. එනම් අධ්‍යක්ෂකවරුන් වගකීමකට යටත් කල හැකිය. (ඒ සඳහා සුවිශේෂී නඩුකර පවතියි.)

(ලකුණු 03)
(මුළු ලකුණු 10)

හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

පරිච්ඡේදය 10 - ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි සහ නව රෙගුලාසි

(a) <u>**වෙළඳ ලකුණ (**Trade Mark)</u>

- එක් ව්‍යාපාරයක නිෂ්පධිතයක් වෙනත් ව්‍යාපාරයක නිෂ්පධිතවලින් වෙනස් කිරීමට උපකාරී වන ඕනෑම ලකුණක්, වචනයක්, සංකේතයක්, උපක්‍රමයක්, වර්ණයක්, හැඩතල හෝ ඒවායේ එකතුවක් වෙළඳ ලකුණක් ලෙස හැඳුන්විය හැක. වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත ලැබුණු දිනයේ සිට ආරම්භ වන වලංගු කාලය අවුරුදු **10**කි. එය නැවත අලුත් කළ හැක.

<u>**ස්වාධිකාරය/ පේටන්ට් (**Patent)</u>

- නව නිමවුමක නිර්මාණකරුවාට**,** එම නිමැවුම ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ගොනු කරන දිනයේ සිට අවුරුදු **20**ක කාලයක් සඳහා වලංගු වන පරිදි මෙම අයිතිය ලබාදේ. නවෝත්පාදනය කරන පුද්ගලයාට රජය ලබාදෙන මෙම අයිතිය**,** අනෙකුත් අය විසින් එම නවෝත්පාදනය සෑදීම**,** භාවිතය සහ අලෙවිය තහනම් කරන ඒකාධිකාරී අයිතිය 'පේටන්ට් අයිතිය' **(Patent Right)** ලෙස හැඳුන්වයි. ***2003*** *අංක* ***36*** *දරන බුද්ධිමය දේපළ පනතෙහි* ***62*** *වන වගන්තියට* අනුව**,** නවෝත්පාදනයක් යනු "තාක්ෂණයෙහි විශේෂ ගැටලුවකට ප්‍රායෝගිකව විසඳුමක් ලබාදිය හැකි**,** නවෝත්පාදකයෙකුගේ **අදහසකි**."

(ලකුණු 04)

(b) හපුතලේ තේ නිෂ්පාදකයින්ට **"Haputale-Tea"** නාමය ආරක්ෂා කරගැනීමට හැක, මන්ද ***2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත*** යටතේ **භූගෝලීය දර්ශක (Geographical Indications - GIs)** දර්ශකයක් ලෙස හඳුනාගැනේ. එවැනි දර්ශකයන් යනු සුවිශේෂිත ස්ථානයකින් උත්පන්න/ බිහි වී, එම ස්ථානයට අදාළ ගුණාංග හෝ කීර්තියක් සමග අනුබද්ධ නිෂ්පාදිත හඳුනාගැනීමට භාවිත කරන සලකුණු වේ.

හපුතලේ තේවල ඇති විශිෂ්ය රසය, එහි කලාපයේ විශේෂිත දේශගුණය, පස සහ සම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රම මත පදනම් වන බැවින්, එය **GI** (භූගෝලීය දර්ශකයක් වශයෙන්) නීතිමය ආරක්ෂාව සඳහා සුදුසුකම් ලබයි. **"Haputale -Tea"** නාමය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තුළ **GI** ලෙස ලියාපදිංචි කිරීමෙන්, නිෂ්පාදකයින්ට එම නාමය පිළිබඳ ස්වකීය **(Exclusive)** අයිතිවාසිකම් ලැබේ. එමඟින්, කලාපයට පිටත අය විසින් නාමය භාවිත කිරීම වැළැක්විය හැක.

ලියාපදිංචියෙන් පසු, හෝ ලියාපදිංචියට පෙර ද, හපුතලේ නිෂ්පාදකයින්ට ගාලු තේ නිෂ්පාදකයාට එරෙහිව නීතිමය පියවර ගත හැක. එනම්, නිෂ්පාදන කලාපය පිළිබඳව ජනතාව රැවටීමට ලක් කරන අයුරින් නාමය වරදවා භාවිත කිරීම (අවභාවිතය), අහිතකර තරඟයක් සහ වැරදි නියෝජනයක් **(Misrepresentation)** වේ.

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

(මුළු ලකුණු 25 කි)

C කොටස

හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

පරිච්ඡේදය 02 - ගිවිසුම් නීතිය

(A)

(a) වලංගු ගිවිසුමකට අවශ්‍ය වන මූලික අංග අතර, අර්පනයක් **(Offer)** සහ ප්‍රතිග්‍රහණය **(Acceptance)** අත්‍යවශ්‍ය වේ.

අර්පනයක් යනු විශේෂිත නියමයන් යටතේ බැඳී සිටින බවට කරන ලද නිශ්චිත පොරොන්දුවක් වන අතර, එය එම යෝජනාව ලැබෙන පුද්ගලයා පිළිගත් විට නීතිමය බලය ලබන බවට අරමුණක් ඇත.

එයට විරුද්ධව, අර්පනයට ආරාධනය **(Invitation to treat)** යනු සාකච්ඡා සඳහා කැඳවීමක් පමණක් වන අතර, වෙනත් අයගෙන් යෝජනා ඉල්ලාගැනීමකි. එය බැඳී සිටින පොරොන්දුවක් නොවන අතර, එය නිදහසේ පිළිගත හෝ ප්‍රතික්ෂේප කළ හැක.

ගිවිසුම් නීතිය මෙවැනි **Invitation to treat** උදාහරණ කිහිපයක් පිළිගැනේ. එවැනි උදාහරණවලට දැන්වීම්, වෙළඳසැල් තුළ ප්‍රදර්ශනය කරන භාණ්ඩ, සහ කැටලොග් තුළ දැක්වෙන අයිතම ඇතුළත් වේ.

මෙම මූලධර්මය ***Pharmaceutical Society of Great Britain V. Boots Cash Chemists*** නඩුවේදී පිහිටුවන ලදී. එහිදී, වෙළඳසැල් රාක්කවල තිබූ භාණ්ඩ අර්පනයට ආරාධනය කිරීමක් **(Invitation to treat)**ලෙස සලකන ලදී. ***Fisher V. Bell*** නඩුවේදීද, වෙළඳසැලක කවුළුවක **flick knife** එකක් දැක්වීම අර්පනයක් නොවන බව තීරණය කරන ලදී.

දී ඇති සිද්ධියේදී, **ABC Music Centre** විසින් ප්‍රචාරක මණ්ඩපයේ දැක්වූ සීමිත ප්‍රමාණයෙන් පවතින සීඩී **Invitation to treat** පමණක් වන අතර, විකිනීමට අර්පනයක් **(Offer to sell)** ලෙස නොපෙනේ. **Hasini** සීඩී එකක් මිලදී ගැනීමට මණ්ඩපයට ගිය විට, ඇය විසින් දැක්වූ මිලට සීඩී මිලදී ගැනීමට අර්පනයක් **(Offer to buy)** කළාය. නමුත් මණ්ඩපයේ සේවකයින්, එම සීඩී විකුණන්නේ නැති බවත්, එය ප්‍රදර්ශනය සඳහා පමණක් බවත් පැහැදිලි කළහ.

එබැවින්, **Hasini** ගේ යෝජනාව පිළිගැනීමක් සිදු නොවූ අතර, **Consideration** (ප්‍රතිෂ්ඨාව) ගෙන යාමක් නැත. අන්‍යෝන්‍ය කැමැත්ත **(Mutual Consent)** ද නොතිබිණ. මේ හේතුවෙන්, වලංගු ගිවිසුමක් සෑදීමට අවශ්‍ය අත්‍යවශ්‍ය අංග අහිමි වී ඇත.

එබැවින්, **Hasini** සහ **ABC Music Centre** අතර වලංගු ගිවිසුමක් ඇති වී නොමැත.

(ලකුණු 04)

(b) මෙම අවස්ථාවේදී, ***Dhanuka*** සහ ***Hasini*** සංගීත ප්‍රදර්ශනය සඳහා ටිකට් ගෙන සංවිධායකවරුන් (***Event Organizers)*** සමඟ ගිවිසුමකට ගියේය. එම ගිවිසුමට අදාළව පහත සඳහන් **මුක්ත වගන්ති/ වගකීමෙන් බැහැර වන වගන්ති** (***Exemption Clauses)*** අඩංගු විය:

"ක්‍රීඩාංගනය ඇතුලතදී ඇති පුද්ගලික බඩු බාහිරාදිය නැති වීම**,** සොරකම් කිරීම**,** හානි වීම සම්බන්ධයෙන් උත්සව සංවිධායකයින් වගකියනු නොලබන බව ඔබ එකඟ වේ.**"**

***Hasini* ගේ ජංගම දුරකථනය නැතිවීම :**

වගකීමෙන් බැහැර වන වගන්ති වලංගුභාවය සංවිධායකවරුන් සමග ගිවිසුමකට යාමට පෙර හෝ යාමේ අවස්ථාවේදී පාර්ශවයන්ට පැහැදිලිව දන්වා තිබීම මත රඳා පවතී. ***Olley V. Marlborough Court (1949)*** නඩුවේදී**,** වගකීමෙන් බැහැර වන වගන්ති ගිවිසුම සකස් කිරීමට පෙර හෝ එය සකස් කරන අවස්ථාවේදී සන්නිවේදනය කළ යුතු බවත්**,** ගිවිසුමට පසු එකතු කළහොත් එය බලපාන්නේ නැති බවත් අධිකරණය තීරණය කළේය.

මෙහිදී**,** සංගීත ප්‍රදර්ශන ටිකට් මතද**,** ප්‍රවේශ මාර්ගය මතද මෙම වගන්තිය මුද්‍රිතව සහ ප්‍රදර්ශනය කර තිබුණි. එබැවින්**, *Hasini*** ගේ ජංගම දුරකථනය ස්ටේඩියම තුළ නැති වූ විට**,** සංවිධායකවරුන් එම මුක්ත වගන්තිය ආරක්ෂාව ලබාදේ. එනිසා**,** ඇයට වන්දි (***Compensation)*** ඉල්ලා සිටිය නොහැක.

***Dhanuka* ගේ රථය හා *Laptop* සොරකම:**

Dhanuka සහ ***Hasini*** පැමිණි විට**,** රථ ගලේ සහයකයෙක් ඔවුන්ට රථය නවතා ගන්නට උපදෙස් දුන්නේය. ඒ සමඟම**,** රථ හානි වීම හෝ සොරකම් වීම පිළිබඳව සංවිධායකවරුන් වගකියන්නේ නැති බව ද අවධාරණය කළේය. මෙම වාචික (කථිත) ප්‍රකාශයත් (***Verbal disclaimer)*** මුක්ත වගන්ති ලෙස ගැනිය හැකි අතර**,** රථය නවතාගැනීමට පෙර පැහැදිලිව දන්වා තිබුණි.

එබැවින්**,** එම වගන්තිය පැහැදිලිව සන්නිවේදනය කර ඇති නිසා**, *Dhanuka*** ගේ ***Laptop*** එක සොරකම් වුවාටත්**,** රථයට හානි වුවාටත් සංවිධායකවරුන් නීතිමය වගකීමට ලක් කල නොහැක.

නිගමනය **-** ඒ අනුව**, *Dhanuka*** සහ ***Hasini*** ට තම දේපළ නැතිවීම පිළිබඳව සංවිධායකවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකි නොවේ.

(ලකුණු 07)

(c) පළමුව, සංවිධායකයින් විසින් අලාභය හෝ සොරකම පිළිබඳව වගකීමෙන් නිදහස් වීම සඳහා නිර්දේශ කරන මුක්ත වගන්ති (Exemption Clauses), එම ගිවිසුමට ඇතුලත් වීමට පෙර හෝ ඇතුලත් වන අවස්ථාවේදී ගිවිසුමට ඇතුළත් කරනු ලබන අතර, ප්‍රේක්ෂකයින්ට පැහැදිලිව දැනුම් දෙන ලද්දේ නම් පමණක් බලපැවැත්වේ.

Olley V. Marlborough Court නඩුවේ ගන්නා ලද ස්ථාවරය අනුව, ගිවිසුම ට ඇතුලත් වූ පසු දැනුම් දෙන මුක්ත වගන්ති ක්‍රියාත්මක/ බලාත්මක නොවේ.

ඒ පරිද්දෙන් දී ඇති කරුණු අනුව, ප්‍රවේශ පත්‍රයේ සහ පිවිසුම් පුවරුවේ දැක්වූ දැනුම්දීම පිවිසුමට පෙර දුන් බැවින්, එය වැඩසටහනට ප්‍රවේශ වීමට ඇති ගිවිසුමේ කොටසක් විය හැකි අතර, ක්‍රීඩාංගනය තුළ තම වටිනා දෑ නැතිවීම සම්බන්ධයෙන් සංවිධායකයින් වගකීමකට යටත් නොවන ලෙස මෙම මුක්ත වගන්ති මගින් ආරක්ෂාවක් සපයයි.

(ලකුණු 04)

(B)

(a) මාලා විසින් ලැප්ටොප් පරිඝණකය මිලදී ගැනීමේදී, භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ (Sale of Goods Ordinance) ව්‍යංග කොන්දේසි සම්බන්ධව ප්‍රතිපාදන වන විකුණන භාණ්ඩ පාරිභිගිකයාගේ අවශ්‍යතාවයට ගැලපෙන (Fitness for Purpose) සහ වෙළඳ ගුණයෙන් යුක්ත (Merchantable Quality) වීම යන ප්‍රතිපාදන පැහැදිලිව ම දී ඇති සිද්දියේ උල්ලංඝනයක් සිදු වී ඇත්තේ ද යන්න මින් මතු විමසිය යුතු ප්‍රශ්නයයි.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15 (1) වගන්තියට ප්‍රකාරව භාණ්ඩ ගණුම්කරුගේ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය වන අතර, මිලදී ගන්නා පුද්ගලයා (ගැනුම්කරු) තමන්ගේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂයෙන් අළෙවිකරුට දන්වා, ඔහුගේ දැනුම සහ විනිශ්චය මත විශ්වාසය තබා මිලදී ගෙන ඇති විට, එම භාණ්ඩය එම අවශ්‍යතාවය සඳහා සුදුසු විය යුතුය. එසේ නොවන්නේ නම් එම ව්‍යංග කොන්දේසිය විකුණුම්කරු විසින් කඩ වීමක් සිදු වේ.

මාලා තමන්ට ග්‍රැෆික් නිර්මාණකරණය (ẏර්චයiජ ẟ;iටබiබට) සහ වීඩියෝ සංස්කරණය (Video Editing) සඳහා අධිකාර්ය සාධන ලැප්ටොප් පරිඝණකයක (High Performance Laptop) අවශ්‍යතාවය අළෙවිකරුට දැන්වූ පසු, අලෙවිකරු විසින් යෝජනා කරන ලද පරිඝනකය ඒ සඳහා සරිලන බවට ඔහුගේ රෙකමරාදුව මත ඇය විශ්වාසය තබා මිලදී ගත්තා ය. එහි පසුකාලීන විවිධ දෝෂ, එනම් දුර්වල දර්ශන විභේදන ශක්තිය (Poor Display Resolution), නිතර උණුසුම් වීම (Frequent Overheating), සහ සති දෙකකින් බැටරි දෝෂය (Battery Failure) මගින් එම ලැප්ටොප් පරිඝනක යන්ත්‍රය වෘත්තීය භාවිතයට අසමත් වූ බව පැහැදිලි අතර, මෙම සිද්ධිමය කරනා Baldry V. Marshall නඩුව හා සමපාත වේ.

මීට අමතරව, 15(2) වගන්තියට අනුව, අලෙවිකරුවෙකු විසින් විස්තරයකට අනුව විකුණන භාණ්ඩ වෙළඳ තත්වයෙන් යුක්ත, සාමාන්‍ය භාවිතයට සුදුසු සහ සාධාරණ කාලයක් පුරා පවත්නා භාණ්ඩයක් විය යුතුය. එහෙත්, එම ලැප්ටොප් එක නිතර දෝෂ පෙන්වීම සහ පහළ මට්ටමේ කාර්ය සාධනය මෙම කොන්දේසිය පැහැදිලිව උල්ලංඝනය කරයි.

ඒ අනුව පැහැදිලි වන්නේ, විකුණුම්කරු විසින් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15(1) වගන්තිය යටතේ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය මෙන්ම, 15(2) වගන්තිය යටතේ භාණ්ඩය වෙළඳ තත්වයෙන් යුක්ත විය යුතුය යන ව්‍යංග කොන්දේසි දෙකම උල්ලංගනය කර ඇති බවයි.

(b)

භාණ්ඩ විකිනීමේ අඥා පනත යටතේ, මාලා මිලදී ගත් ලැප්ටොප් පරිඝනකයේ ඇති දෝෂයන් හේතුවෙන්, පනත ප්‍රකාරව ඇති ප්‍රතිපාදනයන් වන අවශ්‍යතාවයට සුදුසු විය යුතුය (Fit for purpose), යන ව්‍යංග කොන්දේසිය සහ වෙළඳ ගුණයෙන් යුක්ත විය යුතුය (Merchantable Quality) යන ව්‍යංග කොන්දේසිය යන ව්‍යංග කොන්දේසි (Implied Conditions) ද්විත්වයම උල්ලංඝනය කිරීමට හේතු වී ඇත.

මෙම ව්‍යංග කොන්දේසි නිතිය මගින් නියමිත බැවින්, මාලාට භාණ්ඩය ප්‍රතික්ෂේප කර ගිවිසුම අවලංගු කරමින්, ගෙවූ මිල මුළුමනින්ම ආපසු ලබාගැනීමට අයිතිය ඇත.

එසේත් නැතිනම්,විකල්ප ලෙස, ඇය එම ලැප්ටොප් එක පිළිගත්තා සේ සැලකීමට කැමැත්ත දක්වන්නේ නම්, එවිට එම විකුණුම්කරුගේ උල්ලංඝනය (Breach of Implied Condition) තව දුරටත් ව්‍යංග කොන්දේසි උල්ලන්ගනයක් වශයෙන් නොව, ප්‍රතිඥාභාරයක් (Warranty) කඩ කළා ලෙස සලකනු ලබන අතර, එවිට මාලාට සිදු වූ හානිය සඳහා වන්දි (Damage) ලබාගැනීමට අයිතිය ඇත.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

C කොටසෙහි අවසානය

Notice:

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

aat SRI LANKA

© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)